ISSUE NO 06

JANUARY 2024

# Cyber Guardian

Publication for your online safety

Sri Lanka CERT|CC
Sri Lanka Computer Emergency Rediness Team
Coordination Centre





## ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ මූලෝපාය සංවර්ධනයට ලෝකබැංකු තාක්ෂණික සහාය

ශ්‍රී ලංකා සර්ට් ආයතනය ලෝක බැංකුවේ සහය ඇතිව 2024-2027 දක්වා වූ ඉදිරි වසර හතර ඉලක්ක කරගනින් ජාතික සයිබර් ආරක්ෂණ මූලෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙම උපාය මාර්ගයේ පරමාර්ථය වන්නේ ජාතියේ සයිබර් ආරක්ෂණය සහ සයිබර් තර්ජනවලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමයි. ඒ සඳහා ශ්‍රී ලංකා CERT ආයතනය විසින් රාජ්‍ය සහ පෞද්ගලික වෘත්තික නීතිමය ප්‍රතිපත්ති සහ සිවිල් සමාජ ඇතුළු විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාකාරී මැදිහත්වීම ඇතිව උපදේශන සැසි මාලාවක් පවත්වනලදී. මෙමඟින් සයිබර් ආරක්ෂාව සම්බන්ද පුළුල් උපාය මාර්ගික ප්‍රවේශයක් සහිත ඉදිරි දැක්මක් සදහා ප්‍රවේශයක් ලබා ගැනීමට හැකිවිය.

මෙම මූලෝපාය ක්‍රියාත්මක කිරීම තුළින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත අරමුණු අතර (A) පාලන රාමුව සමාලෝචනය සහ ක්‍රියාත්මක කිරීම (B) වත්මන් සහ අනාගත තාක්ෂණය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය (C) දැනුවත්භාවය වැඩි කිරීම (D) වෘත්තීය නිපුණයන් වැඩි දියුණු කිරීම (E) සිදුවීම් වලට ප්‍රතිචාර දැක්වීම සහ මෙහෙයුම් ප්‍රතිසාධන හැකියාවන් වර්ධනය (F) ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම්වල තාක්ෂණික හැකියාවන් වැඩි කිරීම (G) ආරක්ෂිත තීරණාත්මක තොරතුරු යටිතලපහසුකම් වර්ධනය (H) පාර්ශවකාරුවනට පුළුල් ලෙස සහායවීම (I) ජාත්‍යන්තර ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සහ පැවරී ඇති ජාත්‍යන්තර වගකීම් ඉටු කිරීම සහ (J) දේශීය හවුල්කාරිත්වයන් දිරිමත් කිරීම මුලිකවේ.

### ප්‍රධාන අරමුණු

1 -නීතිමය සහ නියාමන රාමු වැඩි දියුණු කිරීම

2 -දැනුම වැඩි දියුණු කිරීම

3 -සූදානම සහ ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාව ශක්තිමත් කිරීම

4 -සහයෝගීතාව වැඩි කිරීම

මෙම මූලෝපාය සංවර්ධන කටයුත්තේ මීළඟ පියවර වන්නේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට පෙර මහජන අදහස් විමසීම සඳහා මෙය ඉදිරිපත් කිරීමයි. විනිවිද භාවයෙන් යුතු මෙම ප්‍රවේශය තුළින් සමස්ත ජාතියේ අවශ්‍යතා සහ අභිලාශයන් පිළිබිඹු කරන ශ්‍රී ලංකාව සඳහා වන ජාතික සයිබර් ආරක්ෂණ මූලෝපායක් (2024-2027) සකසාගැනීම අපේක්ෂා කෙරේ.




## අක්‍රිය GOOGLE ගිණුම් ඉවතට.

වසර දෙකක කාලයක් පරිහරණය නොකර අක්‍රිය තත්වය් පවතින සියලුම **Google** ගිණුම් අක්‍රිය කිරීම මේවනවිට ආරම්භකර තිබේ. **Google** ප්‍රතිපත්තිය අනුව පුද්ගලයකු වසර දෙකක් ඇතුළත සිය ගිණුමට ලොග් නොවන්නේ නම් **Google** ගිණුමක් පරිශීලකයා විසින් භාවිතා නොකරන එකක් ලෙස සලකයි. එහිදී **Gmail** ගිනුම්වෙත එන ලිපි බැලීම පමණක් නොව **Youtube** නැරඹීම හෝ **Google** සෙවීම් කිරීමට හෝ  **Play Store** වෙතින් යෙදුම් බාගත කිරීම ද අදාලවේ.

ගූගල් විසින් මෙවැනි ගිණුම් මකා දැමීම ආරම්භ කරන බවට පසුගිය වසරේ මැයි මාසයේදී අනතුරු ඇඟවීය.එය එසේ කරන්නේ එම අක්‍රිය ගිණුම් අවදානමට ලක්වීමට වැඩි ඉඩක් ඇති නිසා සහ වෙනත් මාර්ගගත අපරාධ සඳහා භාවිතා කළ හැකි බවයි ඔවුන් පවසන්නේ.මෙසේ භාවිතයට නොගන්නා හෝ අමතක වූ ගිණුම් බොහෝවිට රඳාපවතින්නේ පැරණි හෝ නැවත භාවිත කරන ලද මුරපද මත හා සාධක දෙකක සත්‍යාපනයක් සකසා නොමැතිවීමයි .වැඩි ආරක්ෂාවක් පිළිබද සිතාබලීමක් නොමැතිව ආරම්භකරන ලද එවැනි ගිණුම් සයිබර් අපරධ කරුවන්ට ඉතා ලෙහෙසියෙන් ප්‍රයෝජනයට ගත හැකිබව ගූගල් හි උප සභාපති රූත් ක්‍රිචෙලි පවසයි. එම ගිණුම් මගින් ප්‍රහාරකයින්ට යම් යම් ඉල්ලීම් සදහා තැපෑල යැවීමට හෝ පුද්ගලයින්ගේ අනන්‍යතා සොරකම් කිරීමට භාවිතා කළ හැකි බව සමාගම  තවදුරටත් අනතුරු ඇඟවයි.
පරිශීලකයින්ට දන්වා සිටින්නේ ඔබ ලියාපදිංචිවූ  අපගේ සේවාවන් තවදුරටත් භාවිතා නොකරන්නේ නම් එම ගිණුමට වෙනත් කෙනෙකුට අනවසරයෙන් පිවිසීම වැළැක්වීමට මෙම ක්‍රියා මාර්ගය ගෙන ඇති බවයි. පරිශීලකයන්ට  ඔවුන්ගේ ගිණුම් ඉවත් කිරීමට අවම වශයෙන් මාස අටක පූර්වකාලයක් ලබා දෙනු ඇති බව ගූගල් සමාගම පවසයි. ගිණුමක් මකා දැමූ පසු ඒ සමඟ සම්බන්ධිත විද්‍යුත් තැපෑල තවදුරටත් හා විතයට ගතහැකි නොවනු ඇත.  එමෙන්ම පැරණි සහ දැන්  ප්‍රතිසාධනය කර ඇති ලිපින සොරකම් කිරීමට කිසිවෙකුට  නොහැකි වනු ඇත. 2022 වාර්තාවන්ට අනුව දිනපතා **Gmail** භාවිතය පමණක් බිලියන 121 ඉක්මවා ගොස් ඇත.

## ඔබේ දරුවාට අන්තර්ජාලය ආරක්ෂිත තැනක් කරමු.



බොහෝ දෙමවුපියන් සිය දරුවන් අන්තර්ජාලය භාවිතා කිරීම පිළිබද කනස්සලුවන්නේ එමගින් සිදුවිය හැක අහිතකර අත්දැකීම් නිසා බව රහසක් නොවෙයි. නමුත් ඔබේ දරුවාට අන්තර්ජාලය ආරක්ෂිත තැනක් බවට පත්කිරීම කලහැක්කේද ඔබටමයි. ඒ සඳහා මෙම ක්‍රියා පිළිවෙත් ඔබටම අනුගමනයකල හැකියි.

1. ඔබේ දරුවා අන්තර්ජාල සහ සමාජ මාධ්‍ය භාවිතා කරන සෑමවිටම අවධානයෙන් සිටින්න.
2. නාදුනන පුද්ගලයන්ගෙන් ලැබෙන ඇරයුම් කෙටි පණිවුඩ **Email** පිලිබඳ සැලකිලිමත්වන්න.
3. සමාජ මාධ්‍ය මිතුරන් හා තොරතුරු හුවමාරු සම්බන්ධ යෙන් දරුවන්ගෙන් විමසන්න. පින්තූර වීඩියෝ හුවමාරු සිදු නොකරන ලෙස දනුවත්කරන්න.
4. දෙමවුපියන් දරුවන්ගේ ගිණුම්වල පරිශීලක අනන්‍යතා සහ මුරපද පිළිබඳව දැනසිටිය යුතු අතර Multi-factor Authentication වැනි ආරක්ෂිත ක්‍රම අනුගමනය කල යුතුය.
5. අන්තර්ජාලයට සම්බන්ද වන සියලු උපාන්ග සදහා ප්‍රතිවෛරස මෘදුකාංග හා ශක්තිමත් මුරපද ඇතුළු ආරක්ෂිත ක්‍රම අනුගමනය කලයුතුය.
6. ඉගෙනුම් කටයුතු ඇතුළු අනෙකුත් Online සබදතා සදහා භාවිතා කරන Password අන්අය සමග බෙදානො ගන්න.
7. ඔබේ සහ ඔබේ දරුවාගේ ඩිජිටල් අනන්‍යතාව හෙළිවන කිසිවක් සමාජ මාධ්‍ය හා අනෙකුත් වෙබ් අඩවිවල පලනොකරන්න.
8. අන්තර්ජාල සැපයුම් කරුවන්ගේ නිර්දේශය මත හදුන්වා දී ඇති විශේෂ යෙදවුම්  දරුවාගේ සයිබර් ආරක්ෂාව සදහා සුදුසු පරිදි භාවිතා කරන්න.
9. අන්තර්ජාල භාවිතයට ගන්නා පරිගනකය සැමට පෙනෙන සහ සහාය වීමට හැකි ස්ථානයක තබන්න .එය භාවිතා කරණ කාලය සීමා කර වෙනත් භාහිර ක්‍රියාකාරකම් වල යොදවන්න.
10. අන්තර්ජාල අවභාවිතාවක් සැලවූ වහාම අදාළ අංශ වෙත වාර්තා කරන්න.

## Kaspersky නියෝජිතයන් සහ ශ්‍රීලංකා සර්ට් හමුවක්

අන්තර්ජාතික සයිබර් ආරක්ෂණ සහ ප්‍රතිවයිරස සපයන්නකුවන Kaspersky ආයතනයේ  කලාපීය නියෝජිත කණ්ඩායමක් පසුගියදා ශ්‍රී ලංකා CERT ආයතනයේ නියෝජිතයන් සමග සාකච්චාවකට එක්වුහ.
මෙම සාකච්චාවේදී Kaspersky නියෝජිතයන් ඔවුන්ගේ මෑතකාලීන රාජ්‍ය හවුල්කාරිත්ව වැඩසටහන් සයිබර් ආරක්ෂණ උපාය මාර්ග සංවර්ධනයේ දියුණුව සහ ධාරිතා සංවර්ධනය සදහා ගෙනයන අඛණ්ඩ වැඩසටහන් ඇතුළුව සංවිධානය තුළ සිදුකෙරෙන නවතම වර්ධනයන් පිළිබඳ අවබෝධයක් ලබා දෙනලදී. එමෙන්ම ඔවුන් වෙනත් රටවල ජාතික මට්ටමේ සයිබර් ආරක්ෂණ කටයුතු සඳහා මැදිහත්වීම්  පිළිබඳව ද  අවබෝදයක් ලබාදෙනලදී.

***මෙම සාකච්චාව තුළින් Kaspersky සහCERT ආයතනය අතර සහයෝගීතාවය වර්ධනය කරගැනීමට හැකිවූ අතර සයිබර් තර්ජන බුද්ධි තොරතුරු හුවමාරු කරගැනීම ධාරිතා සංවර්ධනය සදහා සහායවීම උපාය මාර්ග සහ ප්‍රතිපත්ති  සංවර්ධනයට සහාය වීම සඳහා විශේෂඥ දැනුම ලබා දීම ඇතුළු විවිධ අංශ සඳහා ශ්‍රීලංකා CERT වෙත සහාය ලබා දීමට කැමැත්ත පළකරණලදී.***

රටේ  සයිබර් ආරක්ෂණ හැකියාව සහ සූදානම ඉහළ නැංවීම සඳහා එම අංශයේ ආරක්ෂණ විසඳුම් සහ සේවා සපයන්නන් සහ සයිබර් ආරක්ෂණ සංවිධාන අතර සහයෝගීතාවයේ වැදගත්කම මෙම සාකච්චාවේදී අවධාරනය කෙරින.

Kaspersky කලාපිය අධ්‍යක්ෂGenie Gan-ප්‍රාදේශීය අධ්‍යක්ෂ (රජයේ කටයුතු සහ රාජ්‍ය ප්‍රතිපත්ති)-සාමාන්‍යාධිකාරී Siang Tiong (දකුණු ආසියාව සහ ආසියාව) මහජන සම්බන්ධතා කළමනාකරු Lee Heng (APAC) සහ ආසියාවේ නැගී එන රටවල විකුණුම් ප්‍රධානී-Sam Yam යන අය මෙම කණ්ඩායමට එක්විය.